**ශීර්ෂය 149 - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයේ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1 **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව |
| 297 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව |
| 299 | ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය |
| 303 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ ලේකම්වරායට හා දෙපාර්තමේන්තුවල ගණන්දීමේ නිලධාරින් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂය** | **අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 149 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 2015 ජූලි 29 |
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව | 2015 අගෝස්තු 26 |
| 297 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 2015 සැප්තැම්බර් 07 |
| 299 | ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | 2015 අගෝස්තු 06 |
| 303 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 2015 අගෝස්තු 31 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම**

---

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම්**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,217 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,962.80 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 236.26 ක සිට රු.මිලියන 1.55 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.85 ක සිට සියයට 9.08 ක් අතර පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 149 | 2,601.07 | 2,364.81 | 236.26 | 9.08 |
| 295 | 107.00 | 105.02 | 1.98 | 1.85 |
| 297 | 30.30 | 27.60 | 2.70 | 8.9 |
| 299 | 17.25 | 15.70 | 1.55 | 8.9 |
| 303 | 461.38 | 449.66 | 11.72 | 2.54 |
| **එකතුව** | **3,217.00** | **2,962.79** | **254.21** | |

**2.2** **ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක් විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 140 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 158.54 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කර තිබුණු ආදායමෙන් පිළිවෙලින් සියයට 8.8 ක් හා සියයට 70.1 ක ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 20.03.02.10 | 130.0 | 141.53 | 11.53 | 8.8 |
| 20.03.02.12 | 10.0 | 17.01 | 7.01 | 70.1 |
| **එකතුව** | **140.0** | **158.54** | **18.54** | |

**2.3** **අත්තිකාරම් ගිණුම්**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තු 04 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 149 | 12.00 | 8.44 | 8.00 | 8.79 | 65.00 | 37.38 |
| 295 | 6.00 | 3.32 | 2.00 | 4.14 | 20.00 | 12.68 |
| 297 | 5.00 | 4.45 | 2.10 | 3.04 | 30.00 | 13.06 |
| 299 | 2.50 | 2.47 | 1.00 | 1.22 | 10.00 | 3.69 |
| 303 | 5.00 | 2.47 | 3.00 | 2.95 | 30.00 | 13.90 |

## 2.4 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ කාර්යාලයක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. 84,524 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 54.13 ක් විය. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **තැන්පත් ගිණුම් අංකය** | **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
| --- | --- | --- |
| | | **රු.මිලියන** |
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 6000/0000/000/0015/0060/000 | 50.91 |
| ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | 6000/0000/000/0015/0154/000 | 0.08 |
| පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0158/000 | 3.14 |
| **එකතුව** | | **54.13** |

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 7 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂය 149 - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් වාහන සම්බන්ධව ලේඛනය පවත්වා නොතිබුණි.

## 3.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන්ට 06 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමට ප්‍රමාණවත් අග්‍රිමයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබා නොදීම නිසා එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9.45 ක සිට සියයට 34.73 ක් දක්වා ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) මේස ලුණු සැකැසීමේ ව්‍යාපෘතියක් සඳහා වැය විෂයකට රු.10,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ඇ) වැය විෂයයන් 12 කට රු.141,394,628 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-------------------------------------------------------------------**

විෂය අංක 14901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.1,081,902 ක ශේෂවලින් එකතුව රු.779,702 ක ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) වැඩ තහනම් කළ හා සේවය අතහැර ගිය නිලධාරින්ගෙන් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හිඟහිටි රු. 161,402 ක ණය ශේෂ අයකර ගැනිමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වි තිබුණි.

3.4 **අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XII පරිච්ඡේදයේ 23:18 වගන්තිය | විධිවිධාන ප්‍රකාරව නිලධාරින් දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 1646 | වාහන 28 කට අදාලව සමාලෝචිත වර්ෂයට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.. |

## 3.5 දේශීය මුල්‍යාකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) පරිසර හිතකාමී ණය යෝජනා ව්‍යාපෘතිය**

2005 වර්ෂයේ ආරම්භ වූ ඉහත සඳහන් ව්‍යාපෘතියෙන් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ණය ලබා දී නොතිබුණි. ක්‍රියාකාරී වසර 5 තුළ අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු ණය මුදල් ප්‍රමාණයෙන් 2014 දෙසැම්බර් 31 දිනට සහභාගිත්ව ණය දෙන ආයතනවලින් අය විය යුතු මුදල රු.1,133,597,701 ක් වූ අතර 2010 වර්ෂයේ සිට චක්‍රීය ණය අරමුදලක් ලෙස ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියට අදාලව මහ බැංකුව අයකරගත් වාරික හා පොළී මුදල රු.5,314,505,883ක් විය.

**(ආ) කුඩා හා සුළු කර්මාන්ත නියාමක හා ව්‍යවසායකත්ව වර්ධන ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා රජය හා ජයිකා ආයතනය සමඟ 2004 දෙසැම්බර් 07 දින එළඹෙන ලද ගිවිසුම ප්‍රකාරව ආරම්භවූ මෙම ණය දෙන ව්‍යාපෘතිය 2012 මැයි 01 දින සිට චක්‍රීය අරමුදලක් ලෙස ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරික්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i). ව්‍යාපෘතියෙන් රු.680,500 ක් වැය කර පරිගණක මිලදී ගෙන තිබුණත්, එම වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත නොකර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මෙහෙයුම් වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii). 2014 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබුණු මුළු ණය ප්‍රමාණය රු.1,009,761,500 ක් වි තිබුණත්, එදිනට ව්‍යාපාතිය වෙනුවෙන් පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල එය රු.825,614,780 ක් ලෙස දක්වා තිබීම නිසා රු.184,146,720 ක ණය ප්‍රමාණයක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(iii). ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන චක්‍රීය අරමුදලේ භාවිතා කළ හැකි අරමුදල් වටිනාකම රු.830,050,000 ක් වුවද, 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම හෙළිදරව් කර නොතිබුණි.

(iv). අරමුදලේ මෙහෙයුම් උපදෙස්වලට අනුව තාක්ෂණික මාරු කිරීම් හා පොදු කටයුතු වෙනුවෙන් අතුරු ණය ලබා දිය හැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී තාක්ෂණික මාරු කිරීම් යටතේ කිසිදු ණය මුදලක් ලබා දී නොතිබුණි.

(v). සමාලෝචිත වර්ෂය තුළ බෙදාහරින ලද මුළු ණය ප්‍රමාණයෙන් රු.මිලියන 267.55 ක් නැතහොත් සියයට 32 ක් ආහාර සැකසුම්, බීම වර්ග හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන්ද, ඉතිරි මුදල වන රු.මිලියන 558.07 අනෙකුත් අංශ 19 වෙනුවෙන්ද බෙදා

හැර තිබුණි. තවද මුළු අතුරු ණය 309 කින් 100 ක් ඉහත අංශය වෙනුවෙන් පමණක් ප්‍රදානය කර තිබුණි. ඒ අනුව අංශ අතර ණය සමානව බෙදා හැර නොතිබුණු බව පෙන්නුම් කෙරිණි.

(vi). 2014 දෙසැම්බර් මාසය වන විට බෙදා හරින ලද මුළු සාමාන්‍ය ණය වලින් රු.516,853,200 නැතහොත් සියයට 62 ක් බස්නාහිර හා වයඹ පළාත්වල ව්‍යවසායකයින් හට ලබාදී තිබුණි.

(vii). මෙහෙයුම් උපදෙස් වලට අනුව ණය ලබා දීමේදී ප්‍රමුඛතාවය ග්‍රාමීය ප්‍රදේශවලට ලබා දිය යුතු වුවත්, නිකුත් කර තිබුණු ණය වලින් රු.271,859,600 ක් හෙවත් සියයට 33 ක්ම බස්නාහිර පළාතේ ව්‍යවසායකයන් හට බෙදා දී තිබුණි.

## 3.6 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

2014 වර්ෂයට අමාත්‍යාංශය සකස් කළ ක්‍රියාකාරී සැළැස්මේ ඇතුළත් කර තිබුණු කර්මාන්තපුර 03 ක් සඳහා රු.මිලියන 586 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යයන්ගෙන් කිසිදු මූල්‍ය හා භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 42 | 15 |
| තෘතියික මට්ටම | 12 | 8 | 4 |
| ද්විතියික මට්ටම | 988 | 685 | 303 |
| ප්‍රාථමික මට්ටම | 99 | 89 | 10 |
| **එකතුව** | **1,156** | **824** | **332** |

**4. ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුව**

**4.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i). | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1674 (ඉ) |
| (ii). | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීමේ කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (iii). | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය |

**4.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 78 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**4.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 29501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.38,650 ක ණය ශේෂ වර්ෂ 3 ක පමණ කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ගිණුම් අනුව භාණ්ඩාගාර පරිගණක වාර්තා සහ දෙපාර්තමේන්තු පොත් අතර ණය ශේෂයන්ගේ රු.289,336 ක වෙනසක් තිබුණි.

(ඇ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 6.3 වගන්තිය අනුව සාමාජික ණය ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**4.5. යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**4.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**4.5.3 අභ්‍යන්තර විගණනය**

**----------------------**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර, එම කටයුතු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයට පවරා තිබුණි. එම ඒකකය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

**4.6 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XV පරිච්ඡේදයේ 9.4 වගන්තිය | විදේශගත වන නිලධාරියෙකුට පසුගිය වර්ෂ 5 ක කාලය තුළ උණුසුම් ඇඳුම් දීමනාව ගෙවා නොතිබුණු බව තහවුරු කර නොගෙන නිලධාරියෙකුට පවුම් 75 ක උණුසුම් ඇඳුම් දීමනාව ගෙවා තිබුණි. |
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | |
| 1993 දෙසැම්බර් 31 දිනැති අංක PPA/6/1/1දරන චක්‍රලේඛය සහ 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 105/9/FG/14 දරන කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | විදේශ චාරිකාව නිම වී දිවයිනට ආපසු පැමිණීමෙන් දින 07 ක් ඇතුළත අදාල විදේශ චාරිකාව සම්බන්ධව වාර්තාවක් විදේශ ගමන අනුමත කළ බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විදේශ ගමන් සම්බන්ධයෙන් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

**4.7** **කාර්යසාධනය**

**----------------**

2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **විදේශ වාණිජ නියෝජනය**

**----------------------------**

ප්‍රවර්ධන සල්පිල් සඳහා සත්කාරක රටවල් වෙත ශ්‍රී ලංකාවේ සහභාගීත්වය හා ලංකාව වෙත සත්කාරක රටෙහි සහභාගීත්වය මෙන්ම ශ්‍රී ලංකාව වෙත දූත පිරිස් පැමිණීමේදි 2013 වර්ෂයට වඩා 2014 වර්ෂයෙහි අඩු වීමක් සිදු වී තිබුණු බැවින් ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ආ) **ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුම්**

-------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව හා පාකිස්ථානය සමඟ 2014 වර්ෂයේදි ඇති කරගත් නිදහස් වෙළෙඳ ගිවිසුම් අනුව රටවල් දෙකෙහිම ආනයන වර්ධනය ඉක්මවා අපනයන ප්‍රමාණය වර්ධනය කර ගැනීමට අපොහොසත්ව පැවතුණි.

**(ii)** ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම අනුව ඇමරිකානු ඩොලර් මිලියන 375.8 ක අපනයන වටිනාකම ඉක්මවා ආනයන වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 540 දක්වා 2014 වර්ෂයේදී වර්ධනයවීතිබුණි.

**(iii)** පාකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම අනුව 2014 වර්ෂයේදි ඇමරිකානු ඩොලර් මිලියන 51.78 ක් ලෙස අපනයන වටිනාකම දැක්වුවද, ඇමරිකානු ඩොලර් මිලියන 79.12 ක් දක්වා ආනයන වටිනාකම වැඩි වී තිබුණි.

(ඇ) **ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම**

---------------------------------------

දෙපාර්තමේන්තුව විසින් වරණීය, කලාපීය, ද්විපාර්ශ්වික සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරන ශ්‍රී ලාංකීය සම්භවීය නිෂ්පාදනයන්ට ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී 117,337 සිට 120,302 දක්වා සියයට 2.5 ක සුළු වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සහ ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ එය පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 27 ක් යන ප්‍රතිශතවලින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික ප්‍රමාණය අඩු වී තිබුණි.

(ඈ) **1949 අංක 06 දරන උකස් පනත යටතේ ණයදෙන ආයතන අනුමත කිරීම**

-----------------------------------------------------------------------------------

1949 අංක 06 දරන උකස් පනත යටතේ, ඕනෑම සමාගමක්, වෙළඳ සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයෙකු අනුමත කරන ලද ණය දෙන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට වාණිජ අධ්‍යක්ෂවරයාට ලැබී ඇති බලය යටතේ 2014 ජනවාරි 13 දින සිට 2017 ජනවාරි 12 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි වසර 03 ක කාලයක් සඳහා පනතේ කාර්යයන් සඳහා පිහිටවූ මණ්ඩලය විසින් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදි ඉදිරිපත් වූ අයදුම්පත් 18 කින් 10 ක් පමණක් නිර්දේශ කර තිබුණි.

එම කාර්යන්ට අමතරව මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති පහත සඳහන් කාර්යයන් පිළිබඳව ප්‍රගතිය පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට නොලැබුණි.

- අපනයන හා ආනයන සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය තොරතුරු සහ දැනුම ව්‍යාප්ත කිරීම තුළින් සිවිල් සමාජය අතර දැනුවත්භාවය ඇති කිරීම.

- අපනයන ප්‍රවර්ධනය
- GSP යෝජනා ක්‍රමය ඇතුළත්ව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ අපනයන දත්ත බැංකුව ලෙස කටයුතු කිරීම
- සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය
- සංචාර ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම

4.8. **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 63 | 50 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 1 | 4 |
| (iii) | ද්විතියික මට්ටම | 72 | 41 | 31 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 17 | 2 |
| | එකතුව | 159 | 109 | 50 |

## 5. ශීර්ෂය 297 – සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

### 5.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | අයිඒඅයි/2002/02 හා 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි |
| (ඇ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| ( ඉ) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඊ) | විදුලි උපාංග පිළිබඳ ලේඛන | මුදල් රෙගුලාසි 454(2) | යාවත්කාලීන කර නොතිබුණි. |

### 5.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 02 ක් සඳහා රු. 2,659,276 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක් හා සියයට 18 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 5.3 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **20.03.02.10 දරන ආදායම් සංකේතය - සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු**

---------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ඉහත සඳහන් ආදායම් සංකේතයෙන් රු.මිලියන 130 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 141 ක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 108 ක ආදායම් රැස්කිරිමට දෙපාර්තමේන්තුව සමත් වී තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.169,475,000 ක ආදායම් හිඟහිට තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා පමණක් රු.73,711,667 ක ආදායම් හිඟහිට තිබුණි. එම ආදායම් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) **20.03.10.12 දරන ආදායම් සංකේතය - පොදු කොන්ත්‍රාත් පනත යටතේ අය කරනු ලබන ගාස්තු**

------------------------------------------------------------------------------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ඉහත සඳහන් ආදායම් සංකේතයෙන් රු. මිලියන 5 ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණු අතර, එම ඇස්තමේන්තුව රු.මිලියන 10 දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 17 ක ආදායම් රැස්කර තිබුණු නිසා රැස්කළ ආදායම සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 170 ක් වී තිබුණි.

## 5.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------------

විෂය අංක 29701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.154,144 ක ණය ශේෂ මාස 06 ක සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අය කර ගැනීමේ කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 5.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 5.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම මඟින් දෙපාර්තමේන්තුව විසින් තම අරමුණු ඉටු කර ගැනීමට සිදු කරනු ලබන එක් එක් කාර්යයන්ගේ ස්වභාවය සහ ඒවා සඳහා වගකිව යුතු නිලධාරීන් සහ අංශ, අරමුණු සාක්ෂාත් කර ගැනීමට ගතවන කාල සීමාව ආදිය වෙන වෙනම දක්වා නොතිබුණි.

### 5.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**5.5.3** **අභ්‍යන්තර විගණනය**

-------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි හා මුදල් රෙගුලාසි 133 (2) ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි.

**5.6** **වත්කම් කළමනාකරණය**

--------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

දෙපාර්තමේන්තුව සතු සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කටයුතු පරිගණක ගත කිරීමේ වැඩසටහන යටතේ ස්කෑන් කරන ලද ලිපිගොනු තැන්පත් කිරීමට රු.453,750 කට මිලදී ගත් රාක්ක 15 ක් භාවිතයෙන් තොරව 2014 නොවැම්බර් 28 දින සිට ලේඛනාගාරයේ ගබඩා කර තිබුණි.

(ii) ප්‍රතිව්‍යුහගතකරණය යටතේ ස්කෑන් ලියකියවිලි නැවත ගොනුගත කිරීමට විශේෂයෙන් සකස් කළ රු.2,180,000 ක් වටිනා ෆයිල් කවර 54,500 ක් 2015 මාර්තු 27 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(iii) 2015 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පාසල්වල පුස්තකාල අතර බෙදාදීමට 2014 දෙසැම්බර් 31 දින රු.683,910 කට මිලදීගත් පොත් පාසල්වලට බෙදා නොදී දෙපාර්තමේන්තු ගබඩාවේ තබා තිබුණි. එම පොත් බෙදාදීමට කිසිදු ක්‍රියාමාර්ගයක් 2015 මාර්තු 27 දින වන විටත් ගෙන නොතිබුණි.

(iv) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කිරීමට රු.147,360 ක් වැය කර තිබුණද, එම අංශය වර්තමානයේ නිෂ්ක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි. එම අංශය ස්ථාපනය කිරීමේදී වැය කළ මුදලින් ලබා ගෙන තිබුණු පරිගණක හා අන්තර්ජාල පහසුකම් ඌන උපයෝජිතව පැවතුණි.

(v) ආයතනය සතුව තිබුණු ඩබල් කැබ් රථයක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ)** **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

--------------------------------------

සමාගම් මැදුර ගොඩනැගිල්ල අළුත්වැඩියාවේදී ගලවා ඉවත් කළ වීදුරු 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත්ව නොතිබුණු අතර මාස 06 කට වඩා වැඩි කාලයක් සුරක්ෂිතභාවයකින් තොරව තැනින් තැන දමා තිබුණු මෙම වීදුරු,ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසි කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 5.7 අනුකූල නොවීම්

------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

සමාගම් මැදුර ගොඩනැගිල්ල අළුත්වැඩියාවේදී උපදේශාත්මක සේවා සැපයූ ආයතනයට, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.4 මාර්ගෝපදේශයට පටහැනිව උපදේශන සේවා ඇස්තමේන්තුවෙන් සියයට 50 ක් හෙවත් රු. 250,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

## 5.8 කාර්යසාධනය

------------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) සමාගම් සහ අනෙකුත් ලියාපදිංචි කිරීම්.

-----------------------------------------

සමාගම් හා අනෙකුත් ලියාපදිංචි කිරීම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| කාර්යය | සංඛ්‍යාව | | වෙනස (අඩුවීම)/වැඩිවීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2014 | 2013 | | |
| නව සමාගම් ලියාපදිංචි කිරීම් | 7,100 | 6,047 | 1,053 | 17.41 |
| ලියාපදිංචි සමාගම්වල ලිපි ගොනු පරීක්ෂා කිරීම් | 10,838 | 10,847 | (9) | (0.08) |
| නාම අනුමත කිරීම | 13,260 | 12,075 | 1,185 | 9.8 |
| පිටපත් සහතික කිරීම | 43,379 | 36,531 | 6,848 | 18.74 |
| ආකෘති පත්‍ර ලියාපදිංචි කිරීම | 72,644 | 70,659 | 1,985 | 2.80 |
| වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම | 31,324 | 29,853 | 1,471 | 4.93 |
| මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම | 2,376 | 2,867 | (491) | (17.12) |
| ආකෘති පත්‍ර අලෙවිය | 3,478 | 4,207 | (729) | (17.33) |

| | | | | |
|---|---|---|---|---|
| ලේකම්වරුන් ලියාපදිංචි කිරීම | 566 | 437 | 129 | 29.52 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම, ආකෘති පත්‍ර අලෙවිය හා ගොනු පරීක්ෂා කිරීමේ ආදායම්, පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණු අතර, ඊට අමතරව අනෙකුත් කාර්යයන්වල ආදායම් වැඩි වී තිබුණත් එම ආදායම් වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව අඩු ප්‍රමාණයක් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ලියාපදිංචි සීමිත සමාගම් 71,110 අතුරින් එදිනට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු සමාගම් සංඛ්‍යාව 59,113 ක් වුවද, එදිනට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ සමාගම් සංඛ්‍යාව 14,886 ක් විය. ඒ අනුව වාර්ෂික වාර්තා ඉදිරිපත් නොකළ සීමිත සමාගම් 44,227 කින් සමාලෝචිත වර්ෂයට අයකර නොගත් හිඟ වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීමේ ආදායම රු.221,135,000 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීමේ හිඟ හිටි රු.508,425,000 ක ආදායම එකතු කර ගැනීමට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් කිසිදු විශේෂ වැඩපිළිවෙලක් 2015 මාර්තු 27 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි .

(ආ) **2007 අංක 7 දරන සමාගම් පනත**

**-----------------------------------**

සමාගම් පනතට අනුකූලව සීමිත සමාගම් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි සමාගම්වල කටයුතු මෙහෙයවීම සහ ඒ අනුව ක්‍රියාකරන බවට වග බලා ගැනීමත්, එසේ ක්‍රියා නොකරන අවස්ථාවලදී ලියාපදිංචි සමාගම්වල කටයුතු සමාගම් පනතේ නියම කර ඇති විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට සමාගම් පනතෙන් පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යයක් වී තිබුණි. ලියාපදිංචි සමාගම්වල කටයුතු නියාමනය දුර්වල තත්ත්වයක පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. එසේම සමාගම්වල කටයුතු නියාමනයට ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සතුව 2015 මාර්තු 27 දින වන විටත් නොතිබුණි.

(ඇ) **විගණකවරුන් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම**

**----------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී නව විගණකවරුන් පිළිවෙලින් 77 දෙනෙකු හා 74 දෙනෙකු අලුතෙන් ලියාපදිංචි කර තිබූ අතර, ඉන් ලැබූ ආදායම පිළිවෙලින් රු.136,590 ක් හා රු.9,900 ක් විය. එමෙන්ම පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම සියයට 1279 ක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ලියාපදිංචි විගණකවරුන්ගේ අලුත් කිරීම් 532 ක් හා 556 ක් බැගින් ලැබුණු ආදායම රු.927,632 ක් හා රු.12,232 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේදී ඉහත ලියාපදිංචිය අලුත් කිරීමේ සංඛ්‍යාව 24 කින් අඩු වුවද, ආදායම රු.915,400 කින් වැඩිවීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 01 දින සිට නව ගණන් පරීක්ෂකවරු ලියාපදිංචිකිරීමේ ගාස්තු සහ අළුත් කිරීමේ ගාස්තු වැඩිකිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඇ) **1891 අංක 16 දරන සමිති ආඥා පනත**

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී 1891 අංක 16 දරන සමිති ආඥා පනත යටතේ පිළිවෙලින් සමිති 67 ක් හා සමිති 169 ක් ලියාපදිංචි කිරීමෙන් ලැබුණු ආදායම පිළිවෙලින් රු.9,325 ක් හා රු.4,225 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 01 දින සිට සමිති ආඥා පනත යටතේ අය කරනු ලැබූ මුද්දර ආදායම අහෝසි කර ගාස්තු අය කිරීම ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඉ) **1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත**

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ විධිවිධාන අනුව රු. මිලියන 5 ක් ඉක්මවන සියලුම කොන්ත්‍රාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි කළ යුතු අතර, සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී ලියාපදිංචි කර තිබූ පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාව පිළිවෙලින් 10,384 ක් හා 4,320 ක් වූ අතර, එමගින් ලැබූ ආදායම පිළිවෙලින් රු.17,016,000 ක් හා රු.6,966,000 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කර තිබූ පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාව 6,064 කින් ද ආදායම රු.10,050,000 කින්ද වැඩිවී තිබුණි. .

## 5.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2007 අංක 7 දරන සමාගම් පනතේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් දරනු ලබන සියලුම වියදම් සමාගම් අරමුදලින් දැරිය හැකි වුවත්, සමාගම් පනතේ 4 වන උප වගන්තිය අනුව අනුමත වියදම් යටතට නොගැනෙන, සීමිත සමාගමක රු.90,275,000 ක් වටිනා කොටස් 2007 මාර්තු 01 දින මිලදී ගැනීමට වැයකර තිබුණි. 2015 මාර්තු 27 දින දක්වා මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් නොලැබුණු අතර මෙම කොටස්වල අයිතිය සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට හිමි වී තිබුණි. කොටස් මිලදීගත් සමාගම් බුන්වත්වීම හේතුවෙන් ඈවර කිරීමට තීරණය කර තිබුණු ඉහත ආයෝජිත මුදලට අදාල අයිතිවාසිකම් හෝ ආයෝජිත මුදල් සමාගම් අරමුදලට ලබාගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් 2007 මාර්තු 27 දින විටත් ගෙන නොතිබුණි.

## 5.10 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සීමිත සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව රු.88,812,227 ක කොන්ත්‍රාත් වටිනාකමකට පෞද්ගලික ආයතනයකට 2014 ජනවාරි 21 වන දින පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව 2014 ඔක්තෝබර් 20 දිනට පෙර එහි වැඩ කටයුතු අවසන් කළ යුතු වුවත්, 2015 මාර්තු 17 දින වන විටත් කොන්ත්‍රාත්තුව අතරමග නවතා තිබුණි. කොන්ත්‍රාත්තුව අනුව සමාගම් සහ සමිතිවල ලිපිගොනු 61,000 ක් ස්කෑන් කර දීමට ගිවිස ගෙන තිබුණද, ලිපිගොනු 33,938 ක් පමණක් කොන්ත්‍රාත්කරු ස්කෑන් කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්තුවේ කටයුතු නිසි පරිදි මෙහෙයවීම සහ අධීක්ෂණය කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර, පසු විපරම් කටයුතු හා ප්‍රගතිය සමාලෝචනය කිරීමක්ද සිදුකර නොතිබුණි. තවද කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන ඇපකරයක් කොන්ත්‍රාත්කරුගෙන් ලබා නොගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2014 දෙසැම්බර් 31 දින

වන විට වැඩ කටයුතු නැවතී තිබුණු මෙම ව්‍යාපෘතියට වැය කළ රු.13,619,577 ක් නිෂ්කාර්ය වී තිබුණි.

(ආ) සමාගම් මැදුර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමකට රු. 12,664,317 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2014 අප්‍රේල් 23 දින පවරා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනට එහි වැඩකටයුතු අවසන් කළ යුතු වුවත්, 2015 මාර්තු 17 දින වන විටත් එහි වැඩ කටයුතු අවසන් කර නොතිබුණු නිසා එහි වැඩ ප්‍රමාදය සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද කළ අලාභ අයකර නොතිබුණි.

## 5.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 06 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 123 | 79 | 44 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 17 | 07 | - |
| (v) | වෙනත් (අනියම්) | - | 01 | - | 01 |
| | එකතුව | 162 | 105 | 58 | 01 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) “සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්” තනතුරට වසර 4 ක පමණ කාලයක සිට ස්ථිර නිලධාරියකු පත් කර නොතිබුණි.

(ii) විවිධ තනතුරුවල 2014 දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව හා දෙපාර්තමේන්තුවේ කාර්යයන් වලට එය බලපෑ ආකාරය පහත දැක්වේ.

| පුරප්පාඩුව පැවති - තනතුර | සංඛ්‍යාව | දෙපාර්තමේන්තුවේ කාර්යයන්වලට වී තිබුණු බලපෑම |
|---|---|---|
| සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් | 03 | මෙම තනතුරු මගින් සමාගම් ලියාපදිංචි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම, වාර්ෂික වාර්තා ආදායම ලබා ගැනීමට කටයුතු කිරීම, සමාගම් ඈවර කිරීමේ කටයුතු සිදු කිරීම, සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමාගම්වලට අදාල සහතික පිටපත් |

| | | |
|---|---|---|
| | | නිකුත් කිරීමේ කටයුතු සිදු කිරීම සිදුවේ. ඒ අනුව, නියාමනය සහ වාර්ෂික වාර්තා ආදායම ලබා ගැනීම දුර්වල මට්ටමක පැවැතීම. |
| ව්‍යාපාර විශ්ලේෂක සහකාර නිලධාරී | 08 | සමාගම් ලියාපදිංචිය සම්බන්ධයෙන් මහජනයාට තොරතුරු සැපයීම, සමාගම් ලියාපදිංචිය සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම හා ආයතනයට අවශ්‍ය පරිදි එම දත්ත නැවත සැකසීම මෙම තනතුර මගින් සිදුවේ. මේ නිසා දෙපාර්තමේන්තුවට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම අපහසු වීම. |
| සමාගම් පරීක්ෂක | 03 | සමාගම් පනතේ විධිවිධානයන් පැහැර හරිනු ලබන සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම වැනි ක්‍රියාමාර්ගවලට ඍජුවම බලපෑම. |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 12 | එක් නිලධාරියෙකුට ලිපිගොනු 1500 ක පමණ වැඩ කිරීමට සිදුවීම නිසා ප්‍රමාදයන් සිදුවීම. |

.

(iii) දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් 12 දෙනෙකුගේ කාර්යයන් ඍජුව අධීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තුවේ නවක නිලධාරීන් හට ආයතනයේ කාර්යයන් හා ඒවා ඉටුකරන ආකාරය පිළිබඳ ප්‍රමාණවත් පූර්ව පුහුණුවක් ලබාදීමේ විධිමත් වැඩපිළිවෙලක් ආයතනය සතුව නොතිබුණි.

## 6. 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

-----------------------------------------------------

### 6.1 ලේඛන හා පොත්පත් පවත්වා ගෙනයාම

-----------------------------------------

ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| | ---------------- | ------------------- |
| (i) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (iii) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |

| | | |
|---|---|---|
| (iv) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (v) | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය |

6.2 **විසර්ජන ගිණුම**

**----------------**

**අයවැය විචලනය**

**------------------**

වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු.1,428,811 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක් හා සියයට 39 ක් වී තිබුණි.

6.3 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------------

විෂය අංක 29901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශ ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂ එකතුව රු.139,410 ක ණය ශේෂ වර්ෂ 05 කට අධික කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6.4** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

-------------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් එම කටයුතු සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා එක් අභ්‍යන්තර විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

6.5 **වත්කම් කළමනාකරණය**

**-------------------------**

**ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා සුරක්ෂිතාගාරයක් ඉදිකිරීම**

**-----------------------------------------------------------------------**

මෙම කාර්යාලයට සුරක්ෂිතාගාරයක් හා අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට රු.22,298,751 ක් වැයකර තිබුණද, එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීම නිසා ගොඩනැගිල්ල ඉදිකිරීමට වැය වූ මුදල ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට ප්‍රතිපූර්ණය කරන ලෙස 2015 අප්‍රේල් 23 වන දිනැති අංක ආමප/ 15/0272/625/007 දරන ආමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් නාගරික සංවර්ධන අධිකාරියට දන්වා තිබුණත් නාගරික සංවර්ධන අධිකාරියෙන් එම මුදල විගණිත දිනයවූ 2015 මාර්තු 10 දින වන විටත් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

6.6 **කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට අදාලව වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම පිළිබඳ කාර්යසාධනයට අදාල තොරතුරු ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | වෙළඳ ලකුණු ලියාපදිංචිය | | පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය | | කාර්මික සැලසුම් ලියාපදිංචිය | |
|---|---|---|---|---|---|---|
| | **2014** | **2013** | **2014** | **2013** | **2014** | **2013** |
| පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙනා ඉල්ලුම්පත් සංඛ්‍යාව | 36,060 | 28,720 | 1,805 | 1,525 | 1,171 | 955 |
| වර්ෂය තුළ ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 8,552 | 8,825 | 536 | 516 | 292 | 346 |
| වර්ෂය තුළ එකතු වී ඇති සංඛ්‍යාව | 44,612 | 37,545 | 2,341 | 2,041 | 1,463 | 1,301 |
| වර්ෂය තුළ ලියාපදිංචි කළ සංඛ්‍යාව | (1,138) | ( 1,485) | (263) | (236) | (529) | (130) |
| ඉදිරි වර්ෂයට ගෙන ගිය ඉතිරි වී ඇති ලිපිගොනු සංඛ්‍යාව | 43,474 | 36,060 | 2,078 | 1,805 | 934 | 1,171 |
| වර්ෂය තුල කෙරීගෙන යන ලිපිගොනු සංඛ්‍යාව | (34,501) | (16,400) | (1,909) | (1,730) | (934) | (729) |
| කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් ලිපිගොනු සංඛ්‍යාව | 8,973 | 19,660 | 169 | 75 | - | 442 |

වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම බුද්ධිමය දේපල කාර්යාලයේ මූලික කාර්යය භාරය වුවද, එය විධිමත්ව සිදු නොවන බව ඉහත සඳහන් තොරතුරු අනුව අනාවරණය විය.

(ආ) වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමයදේපළ කාර්යාලයේ ප්‍රධාන කාර්යය ඉටු කිරීම ඉතා දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් නව නිර්මාණකරුවන් අධෛර්යට පත්වීම සහ නිසි වේලාවට ලියාපදිංචිය නොලැබීමෙන් නව නිර්මාණ තුළින් ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලැබී නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ඉල්ලුම්පත් ප්‍රමාණය කඩිනමින් ලියාපදිංචි කිරීමට 2013 වර්ෂයේ මැයි මාසයේදී කැලි පදනම මත ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දී තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ වෙළඳ ලකුණු ලියාපදිංචිය පසුගිය වසර හා සැසඳීමේදී අයදුම්පත් 347 ක් හෙවත් සියයට 23 ක අඩුවීමක් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ලකුණු, පේටන්ට් හා කාර්මික සැලැසුම් ලියාපදිංචිය කඩිනම් කිරීමට කැලි පදනම මත රු. 1,262,595 ක අමතර පිරිවැයක් ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ අරමුදලෙන් වැය කළද, වෙළඳ ලකුණු හා කාර්මික සැලැසුම් ලියාපදිංචිය සම්බන්ධයෙන්වූ ප්‍රගතිය විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි මට්ටමක තිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් ඉටු නොකිරීමේ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) පරිගණක පද්ධතියක් හඳුන්වාදීමට රු.මිලියන 1.4 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ii) නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු.මිලියන 100 ක් වෙන් කර තිබුණද එම කාර්යයද සිදු කර නොතිබුණි.

## 6.7 මානව සම්පත් කළමනාකරණය

(අ) **අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 05 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 72 | 36 | 36 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 10 | 01 |
| | එකතුව | 94 | 54 | 40 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බුද්ධිමය දේපළ කාර්යාලයේ ප්‍රධාන තනතුර වන බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් තනතුර වසර 02 ක සිට පුරප්පාඩුව පැවතියද එම පුරප්පාඩුව පිරවීමට කටයුතු නොකර වැඩබැලීම සඳහා නිලධාරිනියක් 2014 මාර්තු 15 දින පත්කර තිබුණි. මීට අමතරව සහකාර අධ්‍යක්ෂ තනතුරක්ද පුරප්පාඩුව පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 40 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**7. ශීර්ෂය 303- පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව**

**7.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඉ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |

**7.2 සීමා නොපිළිපැදීම**

විෂය අංක 30301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු අවම ලැබීම් සීමාව රු.3,000,000 ක් වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට තථ්‍ය ලැබීම රු.2,946,176 ක් වීම නිසා අවම ලැබීම් සීමාවට රු.53,824 කින් ළඟා වී නොතිබුණි.

**7.3 විසර්ජන ගිණුම**

**7.3.1 අයවැය විචලනය**

වැය විෂයයන් 08 කට රු. 8,490,662 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 64 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**7.3.2 අමාත්‍යාංශ විසින් ලබා දුන් ප්‍රතිපාදන**

මාතලේ දිස්ත්‍රික්කයේ අත් යන්ත්‍ර පේෂ ගම්මාන පිහිටුවීමට අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදනවලින් රු.5,185,000 ක් වැය කර අත්යන්ත්‍ර මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණද, අත්යන්ත්‍ර ලබා නොගෙන ඊට අදාල චෙක්පත් 2015 ජුනි 29 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.

## 7.4 අග්‍රිම ගිණුම

-------------

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යයන් නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිම වී මාස 01 ක සිට මාස 04 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව රු.50,000 ක අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

## 7.5 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසාන වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ජනාධිපති අතිරේක ලේකම් විසින් 2013 මාර්තු 25 දින අත්‍යන්ත්‍ර මිලදී ගැනීමට ලබාදුන් රු. 2,112,600 ක මුදල 2015 සැප්තැම්බර් 30 දින වන විටත් අදාල කාර්යය ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 7.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------------

විෂය අංක 30301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි රු.117,586 ක ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 11 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ඉඩමක් මිලදී ගැනීම සඳහා දේපල ණය මුදලක් ලබා ගත් නිලධාරිණියක් 2002 වර්ෂයේදී මිය යාම නිසා හිඟහිටි රු.108,465 ක ණය ශේෂය වර්ෂ 12 කට අධික කාලයක සිට පැවැත එමින් තිබුණි. එම ණය මුදල සම්බන්ධයෙන් ඇටෝර්නි බලය ලියාපදිංචි කර නොතිබීම, අදාල ඉඩමේ ඔප්පුව දෙපාර්තමේන්තුව භාරයේ තබා නොගෙන ණය නිකුත් කිරීම පිළිබඳව විමර්ශනයක් පවත්වා අදාල වගකිව යුතු නිලධාරීන්ගෙන් එම හිඟහිටි ණය ශේෂය අයකර ගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ඊට වගකිව යුතු පාර්ශවයන් විශ්‍රාම ගොස් සිටි බැවින් එකී ණය මුදල අයකර ගැනීම සඳහා උපදෙස් ඉල්ලමින් නීතිපති වෙත 2014 ජූලි 01 දින ලිපියක් යොමු කර තිබුණි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ණය මුදල අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ඇ) සැසඳුම් ප්‍රකාශයේ වු කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර රු.195,525 ක වෙනසක් තිබුණි.

(ඈ) විශ්‍රාම ගිය නිලධාරීන් හය දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු ණය ශේෂය රු. 365,517 ක් විය.

## 7.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 7.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් 2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 7.7.2 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 7.7.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත දක්වා ඇති වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) කටුබැද්ද සංකීර්ණයේ නව දේශන ශාලාවේ වෙනත් ආයතනවල පුහුණු වැඩසටහන් පැවැත්වීමට කුලී පදනම මත ලබාදීමට සැලැසුම් කර තිබුණද, එම දේශන ශාලාව සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් යොදවා නොතිබුණි.

(ii) කහවත්තේ හා නුවරඑළියේ පිහිටි පිළිවෙලින් හිරමඩගම හා ශාන්තිපුර යන ජේෂකර්ම පාසල් සමාලෝචිත වර්ෂයේදීද අක්‍රිය තත්ත්වයේ පැවැතුණි.

(iii) දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2013 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව කටුබැද්ද සංකීර්ණයේ නවතා තිබුණි.

(ආ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

මුදල් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණු වාහනයක් 2010 අගෝස්තු 05 දින දෙපාර්තමේන්තුවට ලැබී තිබුණද, එය දෙපාර්තමේන්තුවේ නමට පවරා ගැනීමට 2015 අගෝස්තු 10 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 7.8 බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට වඩා අඩු බැරකම් රු.645,483 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 94 ට පටහැනිව දේශීය ගමන් වියදම් වැය විෂයය වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.47,246 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**7.9 අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 1645 (අ) | සෑම වාහනයක් සම්බන්ධයෙන්ම වාහන ලොග් පොත් පවත්වාගත යුතු වුවත්, වාහන 02 කට අදාල ලොග් පොත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | එක් එක් මාසයට අදාල දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් වාහන 06 ක් සම්බන්ධයෙන් ඒඅනුව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | වාහන සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත්, වාහන 03 ක් සම්බන්ධයෙන් පමණක් කර තිබුණු ඉන්ධන දහනය පරීක්ෂාව වර්ෂයකට වරක් සිදු කර තිබුණි. |
| **(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන චක්‍රලේඛයේ 3 හා 4 ඡේද | 2004 ජනවාරි 01 දිනෙන් පසුව මිලදී ගන්නා ලද වත්කම් සම්බන්ධයෙන් විස්තර ඇතුළත් වාර්තාවක් අර්ධ වාර්ෂිකව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

| | |
|---|---|
| 2013 ජූලි 12 දිනැති අංක එස්ජ්/ජ් එස්/ ජ්ජ් දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමේ කටයුතු 2013 වර්ෂයේදී ආරම්භ කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය අවසන් කිරීමට නොහැකි වි තිබුණි. |

7.10 **කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) **පේෂකර්මාන්ත පුහුණු පාසැල් සඳහා සිසුන් බඳවා ගැනීම**

2013 ජූලි 01 දින සිට 2014 ජූලි 31 දින දක්වා එක් අවුරුදු පේෂකර්ම පුහුණු පාඨමාලාව සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව සිසුන් 150 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණි. ඒ සඳහා සිසුන් 135 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණු අතර, පාඨමාලාව සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව සිසුන් 114 දෙනෙකු විය. ඒ අනුව බඳවා ගත් සිසුන් ප්‍රමාණයෙන් සියයට 84 ක් පමණක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි.

(ii) **මෝස්තර පුහුණු පාසල් සඳහා සිසුන් බඳවා ගැනීම**

මෝස්තර නිර්මාණකරුවන් පුහුණු කිරීම සඳහා නේවාසික එක් අවුරුදු මෝස්තර පුහුණු පාඨමාලාවන් ගැටබේ හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසල්වල පවත්වා ගෙන යමින් පැවැතුණි. 2014 ජනවාරි 06 දින සිට 2015 ජනවාරි 05 දින දක්වා වූ අධ්‍යයන වර්ෂයට සිසුන් 25 බැගින් පාසල් දෙකට සිසුන් 50 දෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂා කළද, ගැටබේ හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසල් සඳහා සිසුන් පිළිවෙලින් 11 ක් හා 05 දෙනෙක් වශයෙන් එකතුව 16 දෙනෙකු පමණක් ඇතුළත් වී තිබුණි. එය ඉලක්කගත සිසුන් සංඛ්‍යාවෙන් සියයට 32 ක් විය.

(ආ) **සැලසුම් කිරීම**

ක්‍රියාකාරී සැලැස්මට අනුව සේවාස්ථ පුහුණු යටතේ බලවේග පේෂකර්මාන්ත පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට රු.200,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. භෞතික සම්පත් හා සම්පත් දායකයින් සපයා ගැනීමේ අපහසුතාවය හා මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවීම යන කරුණු මත එම වැඩමුළුව පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ඇ) **ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

-------------------------------------------------

දෙපාර්තමේන්තුවේ අරමුණුවලින් බැහැර කරුණක් වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් පළ කිරීමට රු.214,200 ක් වැය කර තිබුණි.

**7.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-----------------------------------------

නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.39,948,567 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**7.12 අවිධිමත් ගනුදෙනු**

----------------------

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම**

-------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.300,000 ක ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණද, වර්ෂය තුළදි රු.1,359,729 ක ගෘහ භාණ්ඩ මිල දී ගෙන තිබුණි.

(ii) 2014 ප්‍රසම්පාදන සැලැස්මට අනුව පේෂකර්ම පාසල් උපකරණ මිලදී ගැනීමට රු.700,000 ක් වැය කිරීමට සැලැසුම් කර තිබුණද, 2014 දෙසැම්බර් මාසයේදී පේෂකර්ම ව්‍යාපෘති සඳහා අත්යන්ත්‍ර මිලදී ගැනීමට රු.2,054,900 ක චෙක්පත් ලියා තිබුණු නමුත් 2015 ජුනි වන විටත් එම අත්යන්ත්‍ර ලබා නොගෙන මෙම මුදල 2015 ජුනි 29 දින පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

**7.13 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) **බදු දී ඇති ඉඩම්**

-------------------

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් බලවේග පේෂකර්මාන්ත ව්‍යාපාර හා ඊට අයත් ඉඩම්, ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර දිගුකාලීන බදු පදනම මත පෞද්ගලික ව්‍යාපාරවලට දෙපාර්තමේන්තුව විසින් රු.47,640,000 කට බදු දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 1995 ජූලි 21 දිනැති අංක එස්ද්‍රයි/ඒ/4/34 දරන ජනාධිපති ලේකම් කාර්යාලය චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

- ඉහත චක්‍රලේඛයේ 8(අ) උප ජේදය ප්‍රකාරව ප්‍රතිශෝධිත මුදල කලින් නියම කරන ලද ගණනින් සියයට 150 කට අඩු නොවන පරිදි අවුරුදු 5 කට වරක් බදු කුලී කලින් කලට ප්‍රතිශෝධනය කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේ වුවත් පසුගිය වර්ෂයේදී මේ සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුමකට පිළිතුරු වශයෙන් 2014 වර්ෂයේ සිට බදු මුදල් වැඩි කරන බව පේෂකර්මාන්ත අධ්‍යක්ෂ විසින් විගණනය වෙත දන්වා තිබුණි.
- 8(ඇ) උපජේදය ප්‍රකාරව නිතිපතා බදු කුලී ගෙවීම පැහැර හැරීම නිසා බදු ගිවිසුම ඉබේම අහෝසි වන බව නියම කළද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
- 09 ජේදය ප්‍රකාරව බදු දීමනාකරු විසින් බදු ගිවිසුම නිතිපතා අලුත් කළ යුතු අතර,

හිඟ මුදල් එකතුවීමට ඉඩ නොතබා මුදල් එකතු කිරීමද පෞද්ගලික පාර්ශවකරුවන්ට ඉඩම් බදු දෙන සෑම රාජ්‍ය ආයතනයකම පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වය යටතේ විශේෂ ඒකකයක් පිහිටුවීමද සිදු කර නොතිබුණි.

- 9 (අ) උපඡේදය ප්‍රකාරව බදු දෙන ලද ඉඩම්වලට අදාළව ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- 9(ආ) උප ඡේදය ප්‍රකාරව නියමිත කාලයේදී බදු ගිවිසුම් අලුත් කිරීම සහ නිතිපතා බදු කුලී එකතු කිරීම සිදුවන බවට වගබලා ගැනීම.

- 9(ඇ) උප ඡේදය ප්‍රකාරව බදු ගැනුම්කරු විසින් ගිවිසුමෙහි වගන්ති සහ කොන්දේසි පිළිපැදීම අධීක්ෂණය හා නිරීක්ෂණය කිරීම සහ ගිවිසුමේ වගන්ති සහ කොන්දේසි කඩකළ අවස්ථාවලදී දේපළ පිළිබඳ අයිතිය නැවත ලබා ගැනීම සඳහා නීතිමය පියවර ගැනීම.

(ii) 2012 ජුනි 29 දිනැති අංක පීඑෆ්ඩී/ඒඑස්ඩී/04/02 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව සෑම අමාත්‍යාංශයක් යටතට ගැනෙන දෙපාර්තමේන්තුවල ඉඩම් හා ගොඩනැගිලි රජයේ ප්‍රධාන තක්සේරුකරු මගින් තක්සේරු කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ආ) ලේ වැල්ල බලවේග ව්‍යාපාරය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **බණ්ඩාරවෙල බලවේග පේෂකර්ම ව්‍යාපාරයට අයත් බිබිල හා පස්සර පෙහෙකම්හල**

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සතුව පැවති බණ්ඩාරවෙල බලවේග ආයතනයට අයත් දේපල විකිණීමට අදාල පාර්ශවයන් අතර අත්සන් කළ ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් කොළඹ දිසා අධිකරණයේ පවරා තිබූ නඩුවකට අදාළව 2001 ජුනි 23 දින දුන් තීන්දුව අනුව එදින සිට වසර 03 ක් ඇතුළතදී රු.845,268 ක හිඟ මුදල ගෙවා අවසන් කළ යුතු වුවත්, එම මුදල අය කර ගැනිමට කළමනාකාරීත්වය කාලානුරූපව කටයුතු කර නොතිබුණි.

(ii) **බිබිල රෙදි නිමහුම් ආයතනය**

1996 ජනවාරි 01 දින 99 අවුරුදු බදු පදනම මත රු.150,000 ක වාර්ෂික බදු මුදලකට පුද්ගලික සමාගමකට ඉහත ආයතනය බදු දී තිබුණි. ගිවිසුම ප්‍රකාර බදු මුදල් නොගෙවීම හා අපේක්ෂිත කාර්යයන් සඳහා ඉඩම් හා ගොඩනැගිලි නොයෙදවූ බැවින් ගිවිසුම අවලංගු වී 2011 අගෝස්තු 04 දින නැවත පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට භාරගෙන මැදගම ප්‍රාදේශිය ලේකම්ට භාර දී තිබුණි. 2010 වර්ෂයේ සිට අයවිය යුතුව පවතින රු.1,681,250 ක මුදල අයකර ගෙන නොතිබුණි.

(iii) **හිඟුරක්ගොඩ බලවේග පෙහෙකම්හල**

1993 ජනවාරි 21 දින පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සමඟ වර්ෂයකට රු.108,000 ක බද්දකට යටත්ව ඉහත සඳහන් පෙහෙකම්හල සඳහා ගිවිසුම අත්සන් කර තිබුණි. නමුත් බදුගත් පාර්ශවය විසින් බදු මුදල් ගෙවීම පැහැර හැරීම නිසා 2001 පෙබරවාරි 12 දින මෙම ඉඩම් හා ගොඩනැගිලි හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබුණි. එතෙක් රජයට අයවිය යුතුව පැවති රු.529,600 ක හිඟ බදු කුලී මුදල අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නීතිපති වෙත 2013 නොවැම්බර් 18 දින දන්වා තිබුණද 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් අය කර ගැනිමට නොහැකි වී තිබුණි.

(iv). **කුරුවිට බලවේග පෙහෙකම්හල**

මෙම බලවේග පෙහෙකම්හල බදුගත් ආයතනයෙන් අයවිය යුතු බදු මුදල් අය කර ගැනිමට පැවරූ නඩුවේ තීන්දුවට අනුව අමතර කොටස් හා දණ්ඩන පොලිය ලෙස රු.225,846 ක් ගෙවීමට එකඟත්වය පළකර තිබුණි. අදාල පාර්ශවය විසින් එම ගෙවීම පැහැර හැර තිබුණි. මෙම හිඟ මුදල අයකර ගැනිමට නීතිපති උපදෙස් 2013 නොවැම්බර් 06 දින ලබා ගැනිමට කටයුතු කර තිබුණත්, 2014 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ හිඟ මුදල් අය කර ගැනිමට නොහැකි වී තිබුණි.

(v). **යටිනුවර බලවේග පෙහෙකම්හල**

මෙම ඉඩමේ කොටසක අනවසර පුද්ගලකයකු පදිංචි වී සිටින බැවින් ඉඩමේ නිදහස් සාමකාමී භුක්තිය බදුකරු වෙත භාර දීමට නොහැකි වි තිබුණි.

**(vi).** **තලාතු ඔය බලවේග පෙහෙකම්හල**

2000 දෙසැම්බර් 01 දින රු.148,000 ක වාර්ෂික බදු කුලියකට තිස් අවුරුදු බදු පදනම යටතේ බදු දුන් පුද්ගලික ආයතනයකට බදු දී තිබුණි. එම බදු ගිවිසුම ප්‍රකාරව ඊට අදාළ බදු මුදල් අදාළ පුද්ගලික ආයතනය බදු ගෙවා නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2014 ජනවාරි 29 දිනැති තලාතුඔය ප්‍රාදේශිය ලේකම්ගේ ලිපිය අනුව ඊට පෙර බදු ලබාගත් පුද්ගලික ආයතනයේ බදු ගිවිසුම අවලංගු කර නොමැති බැවින් වෙනත් ආයතනයකට බදු දීමට නොහැකි බවත්, එම ආයතනය මෙම ගොඩනැගිල්ලේ ව්‍යාපාර කටයුතු නොකර අතහැර ගොස් ඇති බවත්, වෙනත් ආයතනයක් මෙම ස්ථානයේ යන්ත්‍රානුසාරයෙන් ගම්මිරිස් වියලීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවත්ය. කෙසේ වෙතත් මෙම ගැටළු නිරාකරණය කරගෙන මෙම දේපළ බදු දීමෙන් අයවිය යුතු රු.1,924,000 ක බදු මුදල අය කර ගැනිමට නොහැකි වී තිබුණි.

(vii) **උඩුනුවර බලවේග පෙහෙකම්හල**

2000 පෙබරවාරි 01 දින සිට තිස් අවුරුදු බදු පදනම මත රු. 216,000 ක වාර්ෂික බදු මුදලකට පුද්ගලයෙකුට මෙම ස්ථානය බදු දී තිබුණි. අදාළ බදු ලබාගත් අයවළුන් විසින් එහි ව්‍යාපාර කටයුතු කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට රු.2,808,000 ක බදු මුදල අය කර ගැනිමට නොහැකි වී තිබුණි.

(viii) **කළුතර බලවේග ව්‍යාපෘතිය**

-----------------------------

රාජ්‍ය සමාගමකට විකුණූ කළුතර බලවේග ව්‍යාපාරයේ අමතර කොටස් වෙනුවෙන් රු.1,991,962 ක අයවිය යුතුව තිබුණි. එම හිඟහිටි මුදල අයකර ගැනීම සඳහා එම සමාගමට එරෙහිව නඩු පවරා 1991 අප්‍රේල් 22 දින සමථයකට පත්ව තිබුණි. ඉහත සඳහන් හිඟ බදු මුදල අයකර ගැනීමේ කාලසීමාව ඉක්මවා ගොස් ඇති බවත්, හිඟ මුදල අයකර ගැනීමේ නිතිමය ප්‍රතිපාදන නොමැති බවත් නීතිපති විසින් දැනුම් දී තිබුණි.

(ඈ) **වන්දි ගෙවීම**

----------------

පෞද්ගලික අංශයට විකුණනු ලැබූ බලවේග පෙහෙකම්හල්වල වර්ෂ 10 ට අඩු සේවා කාලයක් සහිත රැකියාව අහිමි වූ සේවකයන් හට අදියර දෙකක් යටතේ වන්දි ගෙවීම 2014 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතුව තිබුණි. වන්දි ලබා දෙන අවස්ථාව වන විට මියගොස් සිටි, වන්දි ලබා ගැනීම සඳහා අයදුම් කර නොතිබුණු හා අවශ්‍ය ලියවිලි නොමැතිවීම හේතුවෙන් වන්දි ලබා ගැනීමට නොහැකි වූ සේවකයන් සඳහා තවදුරටත් වන්දි ගෙවීමට තිබුණු බවත්, 2015 ජුලි මාසය වන විට වන්දි ගෙවිය යුතු බවට හඳුනා ගෙන තිබුණු 149 දෙනෙකු වෙනුවෙන් එකතුව රු.6,592,000 ක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණු බව අනාවරණය විය.

## 7.14 මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

(අ) **අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

--------------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 05 | 04 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 109 | 93 | 16 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 42 | 25 | 17 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 10 | - | 10 |
| | එකතුව | 157 | 132 | 35 | 10 |

(ආ) **අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

-------------------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සංවර්ධන සහකාර නිලධාරියෙක් 2013 වර්ෂයේ සිට මුදා හැර තිබුණි.